# කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය

### 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනත

## විෂබීජහරණ සහ මහජන ස්වස්ථතා සේවා පවත්වා ගෙන යාම

## නිවේදනය යි!

ශ්‍රී ලංකාව තුළ පළිබෝධ පාලන සේවා පවත්වාගෙන යාම 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නිකුත්කර ඇති අංක 1655/7 සහ 2010.05.25 දින දරණ රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව 2010 අංක 01 දරණ පළිබෝධනාශක (පළිබෝධ පාලන සේවා) පාලන නියෝග අනුව නියාමනය වන විෂයය කි. මහජන සෞඛ්‍ය හා ස්වස්ථතාව සම්බන්ධයෙන් සලකන කල අයහපත් වූ ක්ෂුද්‍රජීවියෙක්, වයිරසයක්, දිලීර වර්ගයක් හෝ වෙනත් වර්ගයක ශාක හෝ සත්ත්ව ජීවයක් "පළිබෝධය" ලෙස සැලකිය යුතු බවත් එකී පළිබෝධයන් මර්ධනය කිරීම සඳහා යෙදීමට අදහස් කරනු ලබන හෝ යොදනු ලබන ද්‍රව්‍ය පළිබෝධනාශක ලෙස සැලකිය යුතු බවත් 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 27 වන වගන්තිය මගින් නියම කොට ඇති බැවින්, එවැනි විෂබීජනාශක භාවිතා කර ක්‍රියාත්මක කරනු ලබන විෂබීජහරණ සහ මහජන ස්වස්ථතා සේවා පැවැත්වීම ද උක්ත පනතේ සඳහන් නීතිමය ප්‍රතිපාදන යටතේ ඇතුළත් වේ. නමුත්, මෙම නියෝගයන්ට අණනුකූල විෂබීජහරණ සහ මහජන ස්වස්ථතා සේවා පවත්වනු ලබන ආයතන සහ එම කාර්යයන් සම්බන්ධ අවිධිමත් වෙළෙඳ ප්‍රචාරණයන් සිදු කිරීම සම්බන්ධයෙන් තොරතුරු වාර්තා වෙමින් ඇත.

1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නිකුත්කරන ලද බලපත්‍ර රහිතව රටතුළ පවත්වාගෙන යනු ලබන සියළුම විෂබීජහරණ සහ මහජන ස්වස්ථතා සේවා පැවැත්වීම සහ ප්‍රචාරක දැන්වීම් සිදුකිරීම උක්ත පනතේ ප්‍රතිපාදන යටතේ දඬුවම් ලැබිය හැකි වරද වේ. එබැවින්, ශ්‍රී ලංකාව තුළ විෂබීජහරණ සහ මහජන ස්වස්ථතා සේවා පැවැත්වීම සිදුකරනු ලබන සියළුම ආයතන විසින් උක්ත පනත යටතේ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙතින් ලබාගත් විධිමත් බලපත්‍රයක් යටතේ පමණක් සිදු කළ යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

විෂබීජහරණ සහ මහජන ස්වස්ථතා සේවා පැවැත්වීම සම්බන්ධයෙන් අවශ්‍ය මූලික නිර්ණායකයන් අතර;

1. විධිමත් ලෙස ලියාපදිංචි කරන ලද ව්‍යාපාරයක් වීම;

2. අදාල පළාත් පාලන ආයතනය විසින් නිකුත් කරන ලද වාර්ෂික ව්‍යාපාර බලපත්‍ර ලබා තිබීම;
3. විෂබීජහරණ සහ මහජන ස්වස්ථතා සේවා පැවැත්වීම සම්බන්ධයෙන් ලබාගත් ප්‍රමිතිකරණ සහතික ලබා තිබීම (උදා: SLS 1672:2020 COVID-19 Safety Management System සහ ISO 20000 Food Safety Management System) හෝ එම සහතික ලබාගැනීම සඳහා කටයුතු කරමින් සිටීම; සහ
4. මහජන සෞඛ්‍ය හා ස්වස්ථතාව සම්බන්ධයෙන් භාවිතා කරනු ලබන සියළුම විෂබීජනාශක නීත්‍යානුකූල ලෙස ලියාපදිංචි නිෂ්පාදන පමණක් වීම;
ඇතුළත් වේ.

උක්ත මූලික සුදුසුකම් සහ පළිබෝධ පාලන සේවා බලපත්‍ර ලබාගැනීම සම්බන්ධයෙන් වූ වෙනත් තොරතුරු, අවශ්‍ය මාර්ගෝපදේශ සහ අයදුම්පත් ආකෘති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ www.doa.gov.lk වෙබ් අඩවියෙන් පරිශීලනය කළ හැකි ය.

ඒ අනුව, සියලුම විෂබීජහරණ සහ මහජන ස්වස්ථතා සේවා පැවැත්වීම සිදුකරනු ලබන සියළුම ආයතන හිමිකරුවන් විසින් මෙම නිවේදනයේ දින සිට මාස 03කට නොවැඩි කාලයක් උක්ත නීත්‍යානුකූල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවස්ථාව ලබාදෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. උක්ත කාලසීමාවෙන් පසුව රට තුළ සිදුකරනු ලබන සියලුම නීති විරෝධී විෂබීජහරණ සහ මහජන ස්වස්ථතා සේවා පැවැත්වීම සිදුකරනු ලබන සියළුම ආයතන හිමිකරුවන් සම්බන්ධයෙන් 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ නෛතික විධිවිධාන යටතේ විධිමත් විමර්ශන පවත්වා නීත්‍යානුකූල පියවර අනුගමනය කරන බවට මෙයින් දැනුම් දෙමි.

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

2021 සැප්තැම්බර් මස 07 වන දින, පේරාදෙණිය.

දුරකතන අංකය: 081 2388135 හෝ 081 2388076

ෆැක්ස් අංකය: 081 2388135

ඊ-මේල් ලිපිනය: rop@doa.gov.lk හෝ pest@sltnet.lk